# Living the Lotus



5
2021
VOL. 188

*Buddhism in Everyday Life*

**Founder's Reflections**

## ධර්ම පුහුණුවේ ආදර්ශමත් චරිත දෙපල

අපේ ශරීරයට හොඳින් ධර්මය බද්ධ වී තිබෙනවා යැයි සිතුවත්, ජීවිතයේ නොයෙකුත් ප්‍රශ්න ගැටළු වලට මුහුණදෙන විට නැවත සාමාන්‍ය මනුෂ්‍යයන්ගේ තත්වයට පත්වී, අඬමින් කෑ ගසමින් කටයුතු කරයි.

බුදු දහමේ මුලික පදනම පටිච්ච සමුප්පාදය වේ. එයින් හේතුවක් ඇතිව සෑම දෙයක්ම ඇතිවන වන බව කියාදෙයි. නොයෙකුත් හමුවීම්ද හේතුන් වන අතර, එම හමුවීම්, යහපත් තත්වයට පත්කර ගැනීමයි අපගේ ධර්ම පුහුණුව වන්නේ. කොපමණ අකමැති පුද්ගලයන් හා හමුවී ගණුදෙනු කිරීමට සිදු වුවත්, ඒ සෑම හමුවීමක්ම තමාව නියම පුද්ගලයෙකු බවට පත් කරන 'දේවදත්ත පරිච්ඡේදයේ' කියාදීම් වන බවට භාරගත යුතුය. එසේම, හමුවන පුද්ගලයන් කුමන ස්වරූපයෙන් සිටියද, ඔවුන් සෑම කෙනාම අනිවර්යයෙන්ම බුදු වන පුද්ගලයන් සේ සලකා ගෞරව කිරීම අගර්හිත බෝධිසත්වයන් වහන්සේ කියාදෙයි.

ජපානයේ ප්‍රසිද්ධ භික්ෂුවක් වන නිචිරෙන් ෂෝනින් තුමා 'බුද්ධාංකුරය' යන වදන නිතරම භාවිතා කලා. අපි හැමෝම තුල බුදු බවට පත්විය හැකි බුද්ධාංකුරයක් තිබේ. එයට නියමාකාරයෙන් ජලය ලබා දෙමින්, හිරු එළියට නිරාවරණය නොකරන්නේ නම්, එම බුද්ධාංකුරය දළු ලා වැඩෙමින්, මල් පිපීමක් සිදු නොවේ. එබැවින් නොයෙකුත් ප්‍රශ්න ගැටළු වලට මුහුණදෙන සෑම විටම මෙම ආදර්ශමත් චරිත දෙපල ගැන සිහි කරමින්, එම සෑම සිදුවීමක්ම යහපත් ආකාරයට භාර ගත යුතුය. එසේම, තමන්ද යහපත් සබඳතාවයක් වී අන්‍යයන් සමඟ කටයුතු කිරීම හදවතේ තබා ගෙන කටයුතු කිරීමෙන්, ටිකෙන් ටික නියම ශ්‍රද්ධාවන්තයෙක් වීමට හැකිවේ.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 72-73

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 188 (May 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙදා ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.



*President's Message*

# කල්පනාකාරීව ජීවත්වීම

**නිවිකෝ නිවානෝ තුමා**
**ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**

## වර්ග නොකරමු

අපි උදෑසන අවදි වූ අවස්ථාවේ සිට නැවත නින්දට යනතෙක්ම සිදුකරන නොයෙකුත් ක්‍රියාවන් නොදැනුවත්වම 'මෙය වැදගත්, මෙය එතරම වැදගත් නොවේ' යනුවෙන් වර්ග කරනවා නොවේද. සූත්‍ර සජ්ජායනය ආදී එසේ වර්ග කිරීමක් කළ නොහැකි වුවත්, උදෑසන පවුලේ අයට කර සුභාෂිංසනයන් එතරම් ගණනකට නොගනී.

නමුත්, ජපානයේ ප්‍ර සිද්ධ සෙන් ගුරුතුමෙකු වන ෂෝජු රෝජින් ලෙස හඳුන්වන දොකියෝ ඊතන් තුමා පවසන්නේ, උදෑසන අවදිව පවුලේ අයට සුභාෂිංසනය සිදු කිරීම, මුහුණ සේදීම, සූත්‍ර සජ්ජායනය බුද්ධ වන්දනාව, රැකියාවට පිටත්ව එහි කරන සියළුම සාකච්ඡා ආදී එකින් එක 'ඉතාමත් වැදගත්' බවයි. ඒ සෑම දෙයකටම හදවත යොමුකරමින් කල්පනාකාරීව කළයුතු බවයි.

එසේ කිරීමට නොහැකි වන්නේ, කාර්යබහුලත්වය නිසා නොවේ, අපි සෑම දෙයක්ම 'වර්ග කරගෙන' සිටින නිසාය. සෑම දෙයකටම අරුතක් හා වටිනාකමක් ඇත. ඒ ගැන කිසිම තැකීමක් නොකර 'මෙයට නම් අවධානය යොමුකල යුතුයි', 'මේක නම් එච්චර ගණන්ගත යුතු නැහැ' ලෙසින් හුදෙක්ම තම පහසුව පිණිස තීරණ ගනී. ඒ තුලින් නොගැලපෙන වචන හා ක්‍රියාවන් සිදු වනවා නොවේද.

'මල් වල ලස්සන වර්ග කල නොහැකියි' සේ වදනක් ඇත. එයින් අදහන් කරන්නේ, තම කැමැත්ත හෝ අකමැත්ත පසෙක ලා බැලූ විට, සෑම දෙයක්ම වැදගත්ම හා අර්ථවත් බව වැටහේවි. ඉහත සදහන් කල ෂෝජු රෝජින් සෙන් ගුරුතුමාගේ 'ෂෝජු' යන්නෙන් අදහන් කරන්නේ, 'තම සිතුවිලි විසිරීමට ඉඩ නොදී, සිතේ එකඟභාවයක් තබා ගැනීම' යන 'සමාධියේ' අරුතයි. එමනිසා අපිද තම පහසුව පසෙකලා 'අද, මේ මොහොතේ' කරන ක්‍රියාවන්ට අවධානය යොමු කිරිම වැදගත්වේ.

## අන්‍යයන් ගැන සිතීමෙන්

තවද කල්පනාකාරීව ජීවත් වීම ගැන තවත් පැතිකඩකින් කල්පනා කර බලන විට, අපේ ගෙදර පයිප්ප වලට උණු වතුර ලබාදෙන ස්විචය දැමුවත් සීත කාලයේදී මුලින්ම සීතල වතුර පැමිණීමෙන් පසුවයි උණු වතුර එන්නේ. නමුත් එම මුලින් පැමිණෙන සීතල වතුර විසි කිරීම නාස්තියක් නිසා නොයෙකුත් වැඩ සඳහා භාවිතයට ගන්නවා. එසේ වතුර පොදක් හෝ නාස්ති නොකර ප්‍රයෝජනයට ගන්නා ආකාරයට නොයෙකුත් උපක්‍රම යෙදීමද කල්පනාකාරීක ජීවත්වීම ලෙසින් ගත හැකිය. නමුත් එය ජලයට පමණක් සීමා නොකර, සාමාන්‍යයෙන් නොසලකා හරින දේ ගැන පොඩි හෝ සැලකිල්ලක් දැක්වීමට හැකි නම්, එයින් සෑම සියළු දෙයකම ආශිර්වාදයෙන් ජීවිතය ගත කරන බවද අවබෝධ වේවි.

කෙටි කවි හා නිසදැස් ආදිය කියවීම තුලින්ද අපගේ දෛනික ජීවිතයට අවධානය යොමු වී, ජීවත්වන වටපිටාව ගැන විමසිල්ලෙන් සිටීමටද හැකිවේ.

මෙහිදී තච්බනා අකෙමි විසින් රචිත නිසදැසක් ගෙන හැර දක්වන්නම්, 'බැලුවත් නොයෙක් කඳු දෙස, පෙනෙන්නේ සිහින් දළු දැමීමය, තිබුනත් නොයෙකුත් වර්ගයේ ගස් කොලන්, එක හා සමානව සුන්දරය දස අතින්'. මෙය වසන්ත කාලයට ගැලපෙනම කවියකි. මෙහි සඳහන් අයුරින් සෘතු හතරේ සිදුවන වෙනස්වීම් වලට දෑස යොමු කිරීමෙන්ද, සාමාන්‍ය මිනිසුන් වන අපගේ ජීවිත වලට සතුට ගෙනදෙයි. එසෙම දැන්, මේ මොහොත ගැන ආදරණීය බවක් දැනී අපගේ හදවත පෝෂණය වේ.

එසේ වුවත් තවමත් 'කල්පනාකාරීව ජීවත්වීම' ගැන අපැහැදිලි සිතුවිල්ලෙන් සිටින තාක්කල්, අපගේ ජීවිතය ආපස්සට ගෙන යයි. එසේ නොමැතිව සෑම විටම අපගේ හැසිරීම හා ක්‍රියාවන් කල්පනාකාරීව තබා ගැනීමට නම් කළ යුත්තේ කුමක්ද.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 24 වන 'ගද්ගද ස්වර (මහා සඬ ඇති) බෝධිසත්වයන්' ගේ පරිච්ඡේදයේදී ඒ ගැන සඳහන් වේ. ගද්ගද ස්වර බෝධිසත්වයන් වහන්සේ නොයෙකුත් සමාධීන් ලබාගත් බව එහි සඳහන් වේ. ඒ සෑම සමාධියක් තුලම බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රාර්ථනයක් ගැබ් වී තිබේ. 'බැඳීමක් තිබෙන පුද්ගලයන් පමණක් නොව, කිසිම සම්බන්ධයන් නොමැති පුද්ගලයන් පවා දුකින් මුදවා ගනිමු', 'පන්දමකින් අවට ආලෝකමත් කරන්නා සේ, ප්‍රඥවේ ආලෝකයෙන් සෑම මනුෂ්‍යයෙකුවම ආලෝකමත් කරමු' සේ සිත එකඟ කරගෙන කටයුතු කිරීම නිසා එවැනි සමාධීන් ලැබූ බව සඳහන් වේ. එසේම අපි තුලද, සමීපයේ සිටින පුද්ගලයන්ට උපකාර කිරීම හෝ ඈත රටක සිටින පුද්ගලයන්ව සතුටට පත්කල යුතුය යන ප්‍රාර්ථනාවන් තිබේ නම්, මුහුණ සේදීම යන දේට පවා හදවත යොමු නොකර, සෑම විටම කල්පනාකාරී ජීවිතයක් ගත නොකර සිටිය නොහැකිවේ.

එමෙන්ම, දකින සෑම දසුනක්ම සුන්දරත්වයෙන් පෙනෙන හැඟීමට පත්වනවා සේම, නිතරම සතුටින් පිරුණු දිනයන් උදා වෙයි.

From *Kosei*, May 2021.

# විශ්වයේ මහා ජීව ශක්ති යේ ආශිර්වාදයෙන් ජීවිතය ගත කිරිමට හැකිව තිබෙනවා

ලෙක්සා සුපත්තා මෙනවිය
බැංකොක් ධර්ම ශාඛාව

මෙම සෙප්පෝව 2021 වර්ෂයේ පෙබරවාරි මස 16 වන දින ඕමේ ධර්ම පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වූ ගකුරින් පාසලේ විදේශීය සිසුන්ගේ උපාධි ප්‍රධානෝත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

සියළු දෙනාගෙන්ම අවසරයි.

මම 1989 වසරේදී ලාඕසයේදී උපත ලැබූ ලෙක්සා සුපත්තා වේ. මාව මිච්බිකි කල බෙන්ජපොන් සාන්ගේ උපකාරයෙන් ගකුරින් අධ්‍යාපනය ලැබීමට යාම ඉලක්ක කර කටයුතු කරමින්, අපි දෙදෙනාම සුදුසුකම් ලැබ ගකුරින් පාසලට ඇතුලත් වුනා.

ගකුරින් පාසලෙන් ගොඩක් දේ ඉගෙන ගන්නට ලැබුනා, විශේෂයෙන් ප්‍රධාන කරුණු 3 ක් මාගේ හදවතේ තැන්පත්ව තිබෙනවා.

පළමු කරුණ වනුයේ 'සාමාජිකයන්ගේ ශක්තියයි'. ගකුරින් පාසලේදී හමුවූ යහළුවන්ගේ පිහිටෙන්, විශාල පිරිසකගේ උදව් උපකාරයෙන් මම මෙතෙක් කල් ජීවත්ව පැමිණි ආකාරය, මමවත් නොදැන සිටි මාගේ ප්‍රාර්ථනාවන් මට වටහා ගැනීමටද අවස්ථාව ලැබුනා. ගකුරින් පාසලට ඇතුලත් වීමට පෙර මම, කුමක් හෝ දෙයක් වූ විට තනියම දුක් විදිමින් කටයුතු කලා. අතීතයේ අනෙක් අය මාව තේරුම් නොගත් අත්දැකීම් තිබෙන නිසා ගකුරින් පාසලට ඇතුලත් වුවත්, අනෙක් අයට මගේ හදවත විවර නොකර සිටියා. තනියම සිටින්නට ඕනා යැයි සිතුවත් නේවාසිකාගාරයේ එය කිරීමට නොහැකිව, එසේ තිබූ එකම තැන වැසිකිළිය පමනක් වුනා. මම එළියට එන්නේ නැතිව, දිගටම වැසිකිළිය තුලට වී සිටින විට මා ගැන සිතමින්, යහළුවන් සියලු දෙනා 'සූ සාන් ඔයා හොදින්ද' යැයි සෑම විටම විමසුවා. ඔවුන් වැසිකිළියේ දොරට මෘදුව තට්ටු කරන ගමන්, මාගේ හදවතේ දොරටද ඉතාම කරුණාවන්තව තට්ටු කරන්නට වුනා. එම ආශිර්වාදයෙන් මම ටිකෙන් ටික මාගේ හදවත විවර කරමින්, හදවතේ තිබූ දේ අන් අයට කීමට හුරු වුනා. යහළුවන් සමග ගත කල ගකුරින් ජීවිතය තුලින්, මම වෙනස් වූ නිසා මාගේ වටපිටාවද වෙනස් වී, මිනිසුන්ට තනිව ජීවත් විය නොහැකි බවත්, මිනිසුන් එකිනෙකාට සහ සම්බන්ධව ජීවත්වන බව වටහා ගත්තා.

'සාමාජිකයන්ව වැදගත්කොට සලකමින්, ලෝකයේ විවිධ ගැටලු නිරාකරණය කල හැකි හොඳින් ධර්මය පහද දෙන්නෙක් වෙන්න ඕනා' යැයි සිතන මාගේ ප්‍රාර්ථනය මට වටහා ගැනීමට හැකිවුනා. නමුත් අනෙක් අතට, සෑම විටම වෙනස්වන මේ ලෝකයට මගෙන් වැඩක් තිබෙනවාද යන හැඟීමටද පත්වුනා. නික්යෝ නිවානෝ තුමා සෑම විටම මිනිසුන්ව දුකින් මුදවාගෙන, ලෝකය නැවත ගොඩනගමින්, ලෝක සාමය ප්‍රාර්ථනා කරමින්, බෝධිසත්ව චර්යයාවේ යෙදුනා වාගේ, මමත් එතුමාගෙන් ඉගෙන ගනිමින්, මුලින්ම ඇස් පනාපිට සිටින පුද්ගලයන්ව වැදගත් කොට සලකමින්, ඔවුන්ගේ හැඟීම් තේරුම් ගෙන, ඔවුනට ගෞරව ආචාර කිරීමට සිතා සිටිනවා.

දෙවන කරුණ වනුයේ 'හෝසා කිරීමේ වැදගත්කම යි'. මගේ අත්දැකීම් අන් අය ඉදිරියේ කතා කිරීමට මැලිවූ නිසා මම හෝසාවට එච්චර දක්ෂ නැතැයි සිතුනා. ගිය වසරේ ඕමේ ධර්ම පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වූ ධර්ම පුහුණුවේදී සිදුවූ සිද්ධියක් නම්, කාර්ය මණ්ඩලයේ ඔකුමුරා සාන්ගේ බිරිඳ වන මසයො සාන් අසනිපව රෝහල්ගත කර සිට, රෝහලෙන් පැමිණි විගසම අපේ ධර්ම පුහුණුවේ උදව්වට පැමිණ, හෝසාවටත් සහභාගි වුනා. නමුත් මම නිරෝගීව සිටියත් හෝසාවෙන් නැගිට යන්න ඕනා යන හැඟීමෙන් සිටියා. කෙසේ වෙතත් මම කතා කරන දෙයට මසයො සාන් හොදින් ඇහුන්කන්දී සිටියා. එය දැක මට අඩෙන්නට වුනා. ඒ අවස්ථාවේදී මට ජීවිතයේ පලමු වතාවට හෝසාවක තිබෙන්නාවූ වටිනාකම අවබෝධ වුනා. ගකුරින් පාසලේ යොෂිකි ඔයිෂි මහත්මිය 'ස්තූතිවන්ත හෝසාවක් කල විට බුදුන් වහන්සේ සතුටට පත් වන බව' පැවසුවා.



ගකුරින් හී පැවති සෙප්පෝව අවසන් වීමෙන් පසුව
(ඉදිරිපෙළ වම්පස සිට තුන් වැනියට සිටියි)

මමත් එදින හොඳ හෝසාවක අත්දැකීම ලැබීම ගැන හදවතින්ම ස්තූතිවන්ත වනවා. 'ස්තූතිවන්ත හෝසාවක්' යනු, එකිනෙකා අතර අවංකව සිතුවිලි හුවමාරු කර ගැනීම තුලින්, එකිනෙකා සමග හදවතින් සහසම්බන්දවී සැමගේම බුද්ධ ශක්තිය අවබෝධ කර ගත හැකි හෝසාවකි. එවන් හෝසාවක් කිරීමට හැකි නම්, මම අරමුණු කරගෙන සිටින 'දීප්තිමත්, කාරුණික, උණුසුම් හදවතින්' තව තවත් සාමාජිකයන්ට ලංවීමට හැකි යැයි සිතනවා. මින් ඉදිරියටත් ගකුරින් පාසල් ජීවන රටාව තුලත්, ධර්ම ශාඛාවේ රාජකාරි තුලිනුත් 'ස්තූතිවන්ත හෝසාවන්' ප්‍රායෝගිකව පුරුදු පුහුණු කිරීමට සිතනවා.

තුන්වන කරුණ වනුයේ 'තමාව වැදගත්කොට සැළකීමයි'. මට දෙවන වසරට ඇතුලත් වීමට හැකි වුනත්, මගේ යහළුවා වන බෙන්ජපොන් සාන්ට ගකුරින් පාසලේ දෙවන වසරට ඇතුලත් වීමේ විභාගය අසමත් වීම නිසා නැවත තමාගේ මව් රටට යාමට සිදු විය. ඒ නිසා මම ඉතාම දුකින්, මින් ඉදිරියට මම කුමක් කලොත් හොඳයිද යැයි කනස්සල්ලෙන් සිටියා. මමත් නැවත මගේ මව් රටට යනවා යැයි සිතා, ගකුරින් පාසලේ ප්‍රධානී ඔතොමෝ මහත්මියට මාගේ හැඟීම පැවසූ විට, එතුමා පැවසූයේ 'තමාව වැදගත්කොට සළකන්න' යන්නයි. මම සැම විටම අවට ඇති දේ පිළිබද පමණක් සිතමින්, මාව වැදගත්කොට සළකා නැති බව එම අවස්ථාවේ වටහා ගත්තා. මුලින්ම තමාව වටහා ගන්නට ඕනා යැයි සිතා, ඇත්තටම මාගේ සිතුවිලි මොනවාද? යැයි මාගේ හදවතේ ශබ්දයට හොඳින් ඇහුන්කන් දීමට පටන්ගත්තා.

'මාගේ හොඳ ගතිගුන වාගේම වැරදි අඩුපාඩුත් අවංකව පිළිගන්න ඕනා', 'මම, මා විය යුතු' යැයි තමාව පිළිගත්විට, මට මාව වැදගත්කොට සැළකීමට හැකි බව වැටහුනා. ඊට පසු දින ගකුරින් පාසලේ ප්‍රධානීතුමිය විසින් 'තමාව වැදගත්කොට සැළකීම යනු තමාගේ හදවතත් ශරීරයත් වැදගත්කොට සැළකීමයි' ලෙසින් පහදා දුන්නා. තමාගේ හදවතත් ශරීරයත් වැදගත්කොට සළකන විට, අවට සිටින අයවත් වැදගත්කොට සැළකීමට හැකි වී, එකිනෙකා සමග සහයෝගයෙන් ජීවිතය වර්ධනය කර ගත හැකි බව ඉගෙන ගත්තා. එමගින් එකිනෙකා තුල තිබෙන බුද්ධ ශක්තිය අවධිවන බව දැනුනා. විශ්වයේ මහා ජීව ශක්තිය තුලින් නිර්මාණය වී තිබෙන මාව, මින් ඉදිරියටත් වැදගත්කොට සැලකීමට සිතනවා.

මම මෙතෙක් කාලයක් ගෙවා ආ ජීවිතය දෙස නැවත හැරී බැලූ විට, 'ජීවිතය පවත්වා ගෙන යාමේදී විවිධ අමාරුකම් වලට හසුවීම නිසා මට ලැබී තිබෙන මේ වටිනා ජීවිතයට ස්තූතිවන්ත වීමට නොහැකිවුනා'. නමුත් දැන් ගකුරින් පාසලේ සාමාජිකයන් සමඟ හමුවීමට හැකිවූ නිසා, 'මේ දක්වා ජීවත් වීමට ලැබීම මහත් වාසනාවක්' යැයි දැනෙනවා. මට ලැබී තිබෙන ජීවිතයේ වටිනාකම අවබෝධ වුනා සේම, එය බුදුන් වහන්සේ, ආදි මුතුන් මිත්තන් හා මෙතෙක් කල් මට නොදැනුනත් මාව ආරක්ෂා කරමින්, එසේම මෙතෙක් කල් මට සහයෝගය දුන් සියළු දෙනාගේම ආශිර්වාදයෙන් බව මට දැන් හැඟෙනවා. ගකුරින් පාසලේදී මට මාව අවබෝධ කර ගැනීමට හැකි වූ නිසා කරුණාවන්ත හදවතක වටිනාකම වැටහී එය මාගේ ජීවිතයට බද්ධ කරගෙන කටයුතු කිරීම තුලින් මම නැවත ඉපදුනා යැයි මට හැගෙනවා.

බැංකොක් ධර්ම ශාඛාවේ මිසුතනි කියොකයිචෝ සාන් සමග කිහිප වතාවක්ම කතාබහ කර, ගකුරින් උපාධි ප්‍රධානෝත්සවයෙන් පසු, මම ලාඕස් වලට ආපසු නොගොස්, බැංකොක් ධර්ම ශාඛාවේ රාජකාරි කටයුතු වල නිරත වීමට තීරණය කලා. ඇත්තෙන්ම එයට බොහොමත්ම ස්තූතියි. උපාධි ප්‍රධානෝත්සවයේදී ඉදිරිපත් කල මාගේ ඉලක්කය වනුයේ 'කවදා හෝ කොතනකදී හෝ කාටහෝ බෝධිසත්ව වරයෙකු ලෙස කටයුතු කල හැකි කෙනෙකු බවට පත් වී, සාමාජිකයන් විශාල පිරිසකට පිහිට වන්නට ඕනා' යන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට, මම ගකුරින් පාසලේදී ඉගෙනගත් දේ අමතක නොකර, කියොකයිචෝ සාන්ගේ අනු දැනුම යටතේ තව තවත් ඉගෙන ගනිමින්, හොඳින් රාජකාරි කර, තව තවත් මාව වර්ධනය කරගනිමින් කවදා හෝ හොඳ ආත්ම විශ්වාසයකින් යුතුව ලාඕස් වලට යාමට බලාපොරොත්තු වෙනවා.

සියළු දෙනාටම බොහොම ස්තූතියි.




ගකුරින් පාසලේ ගුරුතුමිය හා එකම පන්තියේ ශිෂ්‍යයන් සමඟ (ඉදිරිපෙළ මැද සිටියි)

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ
## සාරාංශය හා වැදගත් කරුණු

කර්තෘ: නික්යෝ නිවානෝ

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 27 වන පරිච්ඡේදය, ශුභව්‍යූහ රජුගේ පෙර භවය



මෙම පරිච්ඡේදයේ සදහන් වන්නේ, ශුභව්‍යූහ රජ, රජුගේ බිසව වන විමල දත්තා හා රාජ කුමාරවරු දෙදෙනා වන විමල ගර්භ හා විමල නේත්‍ර ගැන කතාවයි.

### ශුභව්‍යූහ රජුට ඇතිවූ සිදුවීම

රජ බිසව හා රාජ කුමාරවරු දෙදෙනා බුද්ධ හා ධර්මය සරණ ගොස් සිටියා. නමුත් රජතුමා වෙනත් ධර්මයක් පිළිපදිමින් සිටිනිසා, රජතුමාට කෙසේ හෝ බුදුන් හා ධර්මයේ විශිෂ්ටත්වය පහදා දීමට රාජ කුමාරවරු දෙදෙනා සිතුවා. මෙහිදී ජලධර ගර්ජිත සෝෂ සුස්වර නක්ෂත්‍ර රාජ සංකුසුම් තාභිඥ නම් බුදුන් වහන්සේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරන බව අසා, රජ පියාවත් කැටුව එම ධර්මය ශ්‍රවණය කිරීමට යාමට ප්‍රාර්ථනා කරමින්, මව සමඟ රාජ කුමාරවරු දෙදෙනා සාකච්ඡා කලා. එහිදි රජ බිසව පැවසුවේ, 'පිය රජුගේ හදවත පුදුම වන ආකාරයට ප්‍රතිහාර්යයක් දක්වා කැමති කරගැනීම හැර වෙන විකල්පයක් නොමැති බවයි'.

ඉන්පසු රාජ කුමාරවරු දෙදෙනා, රජ පියාගේ ඉදිරියට පැමිණ අහස් උසට නැගී සිට ගනිමින්, ඇවිදිමින්, හිසෙන් හා කකුලේ ඇඟිලි වලින් ජලය හා ගින්දර පිට කරමින් නොයෙකුත් ආකාරයේ පුදුම සහගත ප්‍රාතිහාර්යයන් විදහා දැක්වූහ. එය දැකීමෙන් ඉතා පුදුමය පත්වූ පිය රජතුමා, 'මෙවැනි ප්‍රාතිහාර්යයන් කාගෙන් ඉගෙන ගත්තේද' ලෙසින් විමසා සිටි විට, 'සද්ධර්ම පුණ්ඩරීක නම් ධර්මය දේශනා කරන ජලධර ගර්ජිත සෝෂ සුස්වර නක්ෂත්‍ර රාජ සංකුසුම් තාභිඥ බුදුන් වහන්සේ අපගේ ආචාර්යවරයා වේ' යනුවෙන් රාජ කුමාරවරු දෙදෙනා පිලිතුරු දුන්නා'. එවිට 'එම බුදුන් වහන්සේව බැහැදැකීමට මමත් කැමතියි' ලෙස රජතුමා පැවසුවා. එය ඇසීමෙන් ඉතා සතුටට පත්වූ රාජ කුමාරවරු දෙදෙනා, මෙම අවස්ථාව පැහැර නොහැර, අපි ගිහිගෙය අතහැර එම බුදුන් වහන්සේගෙන් බුද්ධ මාර්ගය ඉගෙන ගැනීමට කැමති, එයට අවසර දෙන මෙන්ද මව් රැජිනගෙන් අවසර ඉල්ලූ විට, එයට අවසර ලැබුනි.

එලෙසින් ධර්මයේ වටිනාකම අවබෝධ කරගත් රාජ කුමාරවරු දෙදෙනා, රජතුමා හා රජ බිසව මෙන්ම, ඇමතිවරුන්, අන්තප්පුර ස්ත්‍රීන් හා රට වැසියනද ධර්මය ඇසීමට බුදු දැකීමට පැමිණියා. එවිට බුදුන් වහන්සේ විසින් 'අනිවර්යයෙන්ම ධර්මාවබෝධය ලබා ගන්නවා' ලෙසින් රජතුමාට විවර ලබාදුනි. එයින් පැහැදුනි රජතුමා තම බාල සොහොයුරාට රාජ්‍ය පවරා, රජ බිසව හා විශාල පිරිසක් සමඟින් පැවිදි වියට පත්වූහ.

## යහපත් හේතු ප්‍රත්‍යයන් තිබේ නම්

ඉන් පසු ඉතා දීර්ඝ කාලයක් ධර්මය පුරුදු පුහුණු වී, සෘද්ධි සමාධිය ලබාගත් රජතුමා බුදුන් වහන්සේට මෙසේ පැවසුහ, 'මට මේ ආකාරයට පත්වීමට හැකිවුනේ පුත් කුමාරවරු දෙදෙනා නිසාය'. එවිට බුදුන් වහන්සේ විසින් 'එය එසේමයි, යහපත් මිත්‍රයන්, නිවැරදි මඟ පෙන්වන්නන් හමුවීම ඉතා විශිෂ්ට හේතු ප්‍රත්‍යයකි. එයින් බුදුන් දැකීමට හැකි වනවාසේම, බුද්ධ ප්‍රඥාව ලබා ගත යුතුයි සේ උද්යෝගය ඇතිවේ' ලෙසින් වදාලහ.

සත්‍ය වශයෙන් එම හේතු ප්‍රත්‍යයන් ඉතා වැදගත් සලකා කටයුතු කල යුතුය. අපිද ගිය ආත්ම වල ධර්මය පුරුදු පුහුණු වී, එම ආනිශංස (හේතු) එකතු කරගෙන, මෙම ආත්මයේ යහපත් ගුරුවරු හා මිත්‍රයන් (ප්‍රත්‍යයන්) හමු වීම නිසා, අද මෙලෙසින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ය ඉගෙන ගැනීමට හැකිවී තිබේ.

එම නිසා, මේ ආත්මයේදී එක් කෙනෙකුට හෝ ධර්මය පැවසීම, ලබන ආත්මයේදීත් මේ ආකාරයට ධර්මය හා හමුවීමේ සාධකය බවට පත්වේ. ශුභව්‍යුහ රජුගේ මෙම සිදුවීමෙන් අපට ඉගෙනගත හැකි මෙම කරුණ, මේ පරිච්ඡේදයේ ඇති පලමුවැනි වැදගත් කරුණ වේ.

## සමීපතමයන් ධර්ම මාර්ගයට ගැනීමට නම්

රජ කුමාවරු දෙදෙනා පෙන්වූ ප්‍රාතිහාර්යයෙන් අදහස් කරන්නේ, ධර්මය ඉගෙන ගෙන, විශ්වාස කිරීමට අනුව, තම ගතිගුණ සියල්ල වෙනස් වී, එදිනෙදා ක්‍රියාකරකම් සම්පූර්ණයෙන්ම වෙනස් වූ බවයි. එසේම, එම ක්‍රියාවන් පිය රජ තුමාට පෙන්වූවා යනු, ධර්මයේ ආනිශංස තුලින් ලබාගත් වෙනස්වීම් පෙන්වා ධර්මයේ වටිනාකම පැහැදිලි කර, පිය රජතුමාගේ හදවත ග්‍රහනය කරගැනීම වේ.

එසේ කෙනෙකුට ධර්මයට මඟ පෙන්වන විට, ධර්මය දේශනා කිරීම අනිවර්යයෙන්ම වැදගත් වනවා සේම, තම ශරිරය භාවිතා කරමින් ආදර්ශමත් වෙමින් කටයුතු කිරීමද තීරණාත්මක සාධකයක් වේ. විශේෂයෙන්ම, පවුල තුල හා රැකියා ස්ථානයේ අයට ධර්මය කියා දීමේදී එය අනිවාර්යය වේ. මන්ද කොපමණ ධර්මය දේශනා කලත්, එම දේශනාවන් කරන පුද්ගලයාගේ කල්ක්‍රියාවන් හොද නැතිනම්, කවුරුත් සෑහීමකට පත්නොවී, ඊට පටහැනිවත් ධර්මය හෙලා දැකිමත් සිදු කරන නිසාය. මෙම කතාන්දරය තුල එවැනි අරුතක් ගැබ් වී තිබේ.

රජ කුමාරවරු දෙදෙනාට ධර්මයේ විශිෂ්ටත්වය විදහා දැක්වීමට යෝජනා කල මව් බිසව ඉතා ප්‍රඥාවන්තයි සේම, තම නොයෙකුත් මතවාද පසෙක දමා සද්ධර්මයට සවන් යොමු කල පිය රජතුමාද ඉතා සුවිශේෂයි. මේ ආකාරයේ නම්‍යශීලි හදවතකින් යුතු පුද්ගලයන්ට ඉතා හොඳින් ධර්මය ග්‍රහණය කර ගැනීමට හැකිවේ.







## නායකයෙකු සතුවිය යුතු ශ්‍රද්ධාවේ ගුණාංග

මෙම පරිච්ඡේදයේ තිබෙන තවත් වැදගත් කරුණක් වන්නේ, රජතුමාගේ ශ්‍රද්ධාවයි. මැති ඇමැතිවරුන්, අන්තප්පුර ස්ත්‍රීන් හා රට වැසියන් දක්වා රජතුමා සමඟ ධර්ම ශ්‍රවණයට පැමිණියා. ඒ ආකාරයට නායකයන් නිවැරදි ධර්ම මාර්ගයට ඇතුළු වූ විට, එහි බලපෑම කොපමණද යන්න මෙම සිදු වීමෙන් පැහැදිලි වේ.

ආගමික ශ්‍රද්ධාව හුදෙක්ම පෞද්ගලික කාරණයක් වනවාසේම, එකිනෙකාගේ නිදහසද වේ. නමුත් එය දේශපාලනය හෝ බලයට ඈඳා ගැනීමෙන් සෑම දෙයක්ම අවුල් වීමට හැකිය. නමුත් නායකයා නිවැරදි ධර්ම මාර්ගයක ගමන් කිරීම දැක, රට වැසියාද ස්වභාවයෙන්ම එහි ආභාෂය ලැබීම වැරදි ක්‍රියාවක් නොවේ, එය යහපත් ප්‍රවණතාවයකි. එබැවින්, නායකත්වයට පත්වන පුද්ගලයන් නිවැරදි ධර්මය තම ශරීරයට ග්‍රහණය කරගත යුතුවන අතරම, එයින් පහල නිලධාරීන්ට බලපෑමක් එල්ල නොවිය යුතුය. නිවැරදි ධර්මයේ පිහිටා කටයුතු කරන නායකයන්ගේ මානව ගුණාංග අනිවාර්යෙන්ම පහල නිලධාරීන්ට ආදර්ශයක් වනවා නොඅනුමානයි. මේ කරුණ මෙම පරිච්ඡේදයේ ඇති වැදගත්ම කරුණකි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත 『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』 ග්‍රන්ථය ඇසුරෙනි
කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P216-P221



# Director's Column



## සතුට හා අසතුටේ හැරවුම් ලක්ෂය

අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා

මේ මස නිච්කෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩය තුලින්, 'තම පහසුව' ගැන පමණක් සිතමින් තීන්දු තීරණ නොගැනීමේ වැදගත්කම කියාදෙන අතරම, සිදුවන සෑම සිදුවීමක්ම අරුතක් තිබෙන වැදගත් දේ ලෙසින් භාරගෙන 'කල්පනාකාරීව ජීවත්වීම' ගැනද මතක්කර දෙයි.

සාමාන්‍ය මනුෂ්‍යයන් වන අපගේ හදවත 'වැදගත් හා එසේ නොවන' ලෙසින් වර්ග කරගෙන ජීවත්වේ. 'වැදගත් දේ' ලෙසින් අපි ආත්මාර්තකාමීව සිතන දේවල් ගැන පරිස්සම් විය යුතු අතරම, එය අපගේ ධර්ම පුහුණුව බවටද පත්වේ. ඒ අනුව සතුට හා අසතුටේ හැරවුම් ලක්ෂය, එදිනෙදා ජීවිතයේ අප හදවත පවත්වා ගන්නා ආකාරය අනුව තීරණය වේ යැයි සිතමි.

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ ප්‍රධාන ධර්ම පුහුණුවක් වන 'අන්‍යයන් ප්‍රථමයෙන්' යන්න තුලින්, සත්‍යය වූ ධර්මයේ පිළී පනින අපගේ ස්වරූපයට ශ්‍රද්ධාව කාවද්දයි.

එසේම, 'දැන්, මේ මොහොත' වැදගත්කොට සලකන සතිපට්ඨානය, මාසික ධර්ම පණිවුඩය තුල සාමාධිය සේ හදුන්වයි. ආත්මාර්තකාමීත්වය සිරවී නොසිට තමා හා සම්බන්ධ වන සෑම බැදීමක්ම වැදගත්ව සැලකීමට හැකිනම් ඒ තුලින් සතුට උදවනවා නොඅනුමානයි. අපි එකිනෙකා ඒ වෙනුවෙන් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගනිමු.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: dharmasa@rksabuddhistcenter.org
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhiln**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247 Email: info@rkuk.org URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**